# III. මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

1968 වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ගිණුම්. II වෙනි පරිශිෂ්ඨයේ 6 වැනි සංඛ්‍යා සටහනේ දක්වෙයි. 1968 දෙසැම්බර් මස අවසානයේ දී පැවති තත්ත්වය, 1967 හා සංසන්දනය කිරීමේ දී ප්‍රධාන වෙනස්කම් වූයේ:-

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් … … … … | + 273.2 | + 14.8 |
| ව්‍යවහාර මුදල් සංසරණය … … … … | + 9.1 | + 0.8 |
| ඉල්ලුම් තැන්පතු … … … … … | + 192.7 | + 27.0 |
| ( එයින් වෙළඳ බැංකුවල ) … … … | — 4.4 | — 3.0 |
| ජාත්‍යන්තර සංචිතය … … … … | — 24.9 | — 9.6 |
| දේශීය වත්කම් … … … … … | + 294.2 | + 16.8 |
| ( එයින් රජයේ සහ රජය විසින් සහතික කළ සුරකුම් පත් ) … … … | + 269.4 | + 19.6 |

\+ වැඩිවීම — අඩුවීම

වර්ෂය තුලදී ස්ටර්ලිං පවුම්, ඉන්දියානු රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් සඳහා වූ පහත දක්වෙන, මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්හි වෙනස් වීම් සිදු නොවීය.

| | | විදුලි පැවරුම් මගින් මිලයට ගැනීම | විදුලි පැවරුම් මගින් විකිනීම |
|---|---|---|---|
| ස්ටර්ලිං පවුම | තැන් මිල | සිලින් 1 පැන්ස 4 53/64 | සිලින් 1 පැන්ස 413/16 |
| (ලංකා රුපියලකට) | ඉදිරි මිල (සමසක් දක්වා) | මසකට තැන් මිලෙන් පැන්ස 1/128 ක් වට්ටම් කොට. | මසකට තැන් මිලෙන් පැන්ස 1/128 ක අධි මිලක් ඇතිව. |
| ඉන්දියානු රුපියල් | තැන් මිල | රු. 79 1/8 | රු. 79 3/16 |
| ( සියයකට ) | ඉදිරි මිල (සමසක් දක්වා) | මසකට තැන් මිලෙන් රුපියලකින් 1/32 ක් | මසකට තැන් මිලෙන් රුපියලකින් 1/32ක අධිමිලක්. |
| එක්සත් ජනපද ඩොලර් | තැන්මිල | රු. 592.25 | රු. 592.50 |
| ( සියයකට ) | ඉදිරි මිල (තෙමසක් දක්වා) | රු. 592.25 | මසකට තැන් මිලෙන් ශත 25 ක අධි මිලක්. |

මහ බැංකුවේ විදේශීය විනිමය ගණුදෙනු II වෙනි පරිශිෂ්ඨයේ 11 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වෙයි,

රජයේ සුරැකුම් පත් ඇපයට තබාගෙන සහ වානිජ හා නිෂ්පාදන ණයමුදල්වලට ඉවහල් වන භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන දෙනු ලබන අත්තිකාරම් සඳහා අයකරනු ලබන මහ බැංකුවේ පොළී අනුපාතිකයන් 1968 මැයි මස 6 වෙනි දින සිට අවුරුද්දකට සියයට 5 සිට සියයට 5½ දක්වා වැඩි කරන ලදී. සහතික මිල ක්‍රමය යටතේ වී මිලයට ගැනීමට හා දේශීය වශයෙන් වවන ලද කෘෂිකාර්මික නිෂ්පාදන මිලට ගැනීම, විකිණීම හෝ ගබඩාකර තැබීම ආදී කටයුතු සඳහා මුදල් සපයනු වස් සමුපකාර සමිති වෙත දෙනු ලබන අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් ඉවහල් වන භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන මහ බැංකුව විසින් වාණිජ බැංකුව වෙත දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් අය කෙරෙන පොළී අනුපාතය වර්ෂයකට සියයට 3 ක් වශයෙන් නොවෙනස් ව පැවතුණි.

වී, රතුළූණු, බොම්බායෙ ළූණු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු වර්ග නිෂ්පාදනයට අදළ වන, සමුපකාර සමිති මගින් දී ඇති භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන, මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත දෙනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් අය කෙරෙන පොළී අනුපාතය වර්ෂයකට සියයට 1½ වශයෙන් ස්ථාවර කෙරිණ. එහෙත් මෙම අනුපාතය භාවිතා කෙරෙනුයේ මෙම පහසුකමෙන් ප්‍රයෝජනය ගන්නා වූ වාණිජ බැංකු විසින් පොරොන්දු නෝට්ටු කාරකයන්ගෙන් වර්ෂයකට ( නියමිත දිනට ගෙවීම සිදු කළහොත් වර්ෂයකට සියයට 3 ක අඩු කිරීමකට අවනත වන සේ ) සියයට 8 ට වැඩියෙන් අය නොකළොත් පමණකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය අවසන් වරට පිළිගත් ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යයට වඩා වර්ෂයකට සියයට ¼ ක්ව තවදුරටත් පැවතුණි.

විශේෂයෙන් සඳහන් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු, ලංකාවේ ක්‍රියාත්මක වන වෙළඳ බැංකු වෙතින් නියමිත මිල ගණන්වලට මහ බැංකුව විසින් මිලදී ගැනීම සඳහා 1968 අගෝස්තු මස සිට විධිවිධාන යොදන ලදී.

**ණය සහතික ක්‍රමය :—**

මෙම ක්‍රමය අනුව වී, රතුළූණු, බොම්බායෙළූණු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු වර්ග වගා කිරීම සඳහා වාණිජ බැංකු මගින් සමුපකාර සමිති වෙත දෙනු ලබන ණය මුදල්වලින් ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට හැත්තෑ පහක ප්‍රමාණයක ගෙවීම් ඈඩුව වෙනුවෙන් මහ බැංකුව විසින් සහතික කෙරේ. සහතික කිරීමේ ගාස්තුවක් වශයෙන් සියයට එකකින් අඩක් වාණිජ බැංකු විසින් ගෙවිය යුතුය. 1968 දෙසැම්බර් 31 වන දිනට වාණිජ බැංකුව විසින් දී ඇති රුපි. 75,633,000 ක ණය මුදල් මහ බැංකුව විසින් සහතික කොට තිබුණි.

**මධ්‍යම හා දිගු කාලීන ණය :—**

වර්ෂය තුළදී, මහ බැංකුවේ මධ්‍යම හා දිගුකාලීන ප්‍රති මූල්‍ය පහසුකම් වලින්, ණය දෙන ආයතන වැඩිපුර ප්‍රයෝජනය ගෙන ඇත. ප්‍රති මූල්‍ය ණය මුදල් රුපි. 5,228,000 ක ප්‍රමාණයක් (වර්ෂය තුළදී ණය දෙන ආයතන වෙත) දී තිබුණි. මහ බැංකුව විසින් දෙනු ලබන ප්‍රති මූල්‍ය ණය මුදල් වෙනුවෙන් අයකරනු ලබන පොළී අනුපාතික 1968 නොවැම්බර් මස 1 වැනි දින සිට පහත සඳහන් අයුරු සංශෝධනය කෙරිණ.

(අ) කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි වැඩි දියුණුවට හෝ සංවර්ධනයට — වර්ෂයකට සියයට 4 ක්,

(ආ) තේ පාලක තැන විසින් ණය මුදල්වල පොළීවලින් කොටසක් ගෙවනු ලබන්නේ නම් ( අළුත් තේ කර්මාන්තශාලා ගොඩ නැගීමට ) තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට සහ/නැතහොත් )

1. දේශීය වියදම පියවා ගැනීම සඳහා ප්‍රති මූල්‍ය ණය වෙනුවෙන් — වර්ෂයකට සියයට 5 ක්.

2. විදේශීය විනිමය වියදම් පියවා ගැනීම සඳහා ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් — වර්ෂයකට සියයට 7 ක්.

(ඇ) වෙළඳ, වාණිජ හා ව්‍යාපාර වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා–වර්ෂයකට සියයට 5½ ක්,

**නෝට්ටු නිකුතුව :—**

1968 අවසානයේදී සංසරණයවූ මුළු ව්‍යවහාර මුදල රුපි. දශලක්ෂ 1,181.9 ක් විය. මී වූ කලී 1967 වර්ෂයේ අවසානයට වඩා රුපි. දශලක්ෂ 109.1 ක වැඩිවීමකි. සංසරණය වූ නෝට්ටුප්‍රමාණය රු. දශලක්ෂ 104.6 කින් වැඩි වූ අතර කාසි ප්‍රමාණය රුපි. දශලක්ෂ 4.5 කින් වැඩි විය.

ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය පිළිබඳ විශේෂ කාසි නිකුතුව සම්බන්ධයෙන්, 1968 ඔක්තෝබර් මාසයේදී රුපියල් 2 ක වටිනාකමක් ඇති අළුත් කියුප්‍රො නිකල් කාසියක් නිකුත් කරන ලදී. ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ කාසි නිකුතුව නිමිත්තෙන් රුපියල් දෙකේ අළුත් තඹ නිකල් කාසියක් 1968 ඔක්තෝබර් මාසයේදී නිකුත් කරන ලදී. අඟල් 1.240 ක විශ්කම්භයකින් හා කවාකාර හැඩයකින් යුත් මෙම කාසියේ බර ග්‍රෙන්ස් 190 කි. කාසියෙහි ඉදිරිපස මැද, පොලොන්නරුවේ පිහිටි, මහා පරාක්‍රමබාහු රජතුමාගේ යැයි විරාගතව සලකනු ලබන ප්‍රතිමාවේ අනුරුවක් සහ ඒ දෙපසේ වී කරල් වලින් යුක්ත මෝස්තරයක් ද, යටින් වී බිස්සක් ද දිස්වෙයි. කාසියේ පරිධියට ආසන්නව '' ආහාර වැඩියෙන් වගා කරනු '' යන ආදර්ශ පාඨය එහි දෙමළ සහ ඉංග්‍රිසි අනුවාදයන් ද සහිතව දිස්වෙයි. කාසියේ පසුපස, මැද විශාල '' 2 '' ඉලක්කම දිස්වේ. එම '' 2 '' ඉලක්කම හරහා '' රුපියල් දෙකයි '' යන වටිනාකම, සිංහල, දෙමළ, හා ඉංග්‍රිසි යන වචනවලින් දිස්වෙයි. '' ශ්‍රී ලංකා'' යන වචන '' 2 '' ඉලක්කමට උඩින් දිස්වන අතර එහි දෙමළ හා ඉංග්‍රිසි අනුවාදයන් පිළිවෙලින් ''2'' කේ ඉලක්කමට වම්පසින් හා දකුණු පසින්, ඇලයන්හි දිස්වේ. 1968 දනම ''2'' ඉලක්කමට යටින් දිස්වේ. මෙම කාසිය එම සඳහන් වටිනාකම ඇති නෝට්ටුවද සමග සංසරණයේ පවතී.

**විදේශීය විනිමය සහතික ක්‍රමය :—**

1968 අංක 28 දරණ විදේශීය විනිමය හිමිකම් සහතික පනත ප්‍රකාර, ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකාණ්ඩුව වෙනුවෙන් විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය පාලනය කරයි.

**ආදායම සහ වියදම :—**

මහ බැංකුවේ වර්ෂයේ ආදායම රුපියල් 3,34,58,000 ක් වූ අතර සංචිත සඳහා වෙන් කිරීම් හා බැංකු ගොඩනැගිල්ලේ වටිනාකම ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ඇතුළත්ව වියදම රුපියල් 3,24,58,000 කි. රුපියල් 1,000,000 ක ශුද්ධ ලාභය මුදල් නීති පණතේ 39 ''බී'' වගන්තියට අනුව අතිරික්තයනට එක් කෙරිණ.

**බැංකු පරිපාලනය :—**

මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් 1968 වර්ෂය තුළදී වෙළෙඳ බැංකු හතක් පරීක්ෂණයට භාජන කරන ලදී. 1961 අංක 65 දරන මුදල් නීති පනතේ iii කොටස ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කාර්යයන් දෙපාර්තමේන්තුව දිගටම කරගෙන යන ලදී.

සංවර්ධන මූල්‍ය අංශය, ආසියානු බැංකුව මහ බැංකුවට ලබා දුන් ණය මුදලේ අවශ්‍යතාව යන්ට අනුකූලවන අන්දමින් තේ කර්මාන්ත ශාලා නවීකරණ වැඩ පිළිවෙල අගැයීමේ කටයුතු වල නිරත විය.